# පනස්හයේ දරුවන් ඉගෙන ගතයුතු පාඩම්

ලබන වසරෙහි පනස්හයට පනස්වසරක් පිරෙයි. බ්‍රිතානියට විරුද්ධව කරන ලද යටත්විජිත විරෝධී අරගලයෙහි හතරවැනි වැදගත් සටන ලෙස සැලකිය හැකි පනස්හය, පනස්හයේ දරුවනට නම් විශිෂ්ට සංසිද්ධියකි. එදා අරගලයෙහි ප්‍රධාන සටන්පාඨය සිංහල බස රාජ්‍ය භාෂාව කිරීම නම් අද වැදගත් ම සටන් පාඨය වී ඇත්තේ රටේ ඒකීයබව සුරකිමු යන්න ය. මෙරට වැසියන් යටත්විජිත විරෝධී නිදහස් අරගලයෙහි විවිධ ස්වරූපවලින් යෙදී ඇත. 1948 දී ලේ බිඳුවකදු නොහෙළා නිදහස දිනාගත්තේ ය යන්න ජනතාව මුළාකිරීමක් පමණ ය. 1817-18 දී මෙන් ම 1848 දීත් වෙනත් අවස්ථාවලදීත් ලේ ධාරා නොව ගංගා ගලාගොස් ඇත.

සිංහලයෝ විවිධ ආකාරයෙන් යටත්විජිත විරෝධී අරගලයේ යෙදෙති. අමද්‍යප ව්‍යාපාරය ද මෙරට නිදහස් සටනෙහි එක් පරිච්ඡේදයකි. ඒ පරිච්ඡේදය එක් වකවානුවකට පමණක් සීමාවූවක් නො වෙයි. සිය වසරක් පුරා අමද්‍යප ව්‍යාපාරය මෙරට පැවතී ඇත. පියදාස සිරිසේන මහතාගේ නවකතා මෙන් ම ඇස් මහින්ද හිමියන්ගේ කවි ද මෙරට නිදහස් සටනෙහි නොමැකෙන පිය සටහන් වෙයි. 1817-18 හා 1848 පැහැදිලිව ම යටත්විජිත විරෝධී අරගලයෙහි දේශපාලන සංරචකය ඉස්මතු වූ අවස්ථා ය. ඉන්පසු මෙරට නිදහස් සටනෙහි වැඩි බරක් යෙදී ඇත්තේ සංස්කෘතික සංරචකයට ය. අද නැවත වරක් දේශපාලන සංරචකය ඉදිරියට පැමිණ ඇත. රටේ ඒකීයබව සුරැකීම යනු දේශපාලන ක්‍රියාවකි.

අද ජාතික බලවේගය, විජාතික බලවේගය, දේශීයත්වය, අපේ කම ආදී වචන නිතර දෙවේලේ අසන්නට ලැබෙයි. ඒ ඉතා වැඩදායක ය. රනිල් වික්‍රමසිංහ මහතා පවා රට එක්සේසත් කිරීමක් ගැන තම ඊනියා ජනතා න්‍යාය පත්‍රයෙහි සඳහන් කරයි. එහෙත් එක්සේසත් කිරීම යන මාතෘකාව යටතේ ඒ මහතා කතාකරන්නේ රට එක්සත් කිරීමක්, එනම් සන්ධීය හෙවත් ෆෙඩරල් රාජ්‍යයක් ඇතිකිරීම ගැන ය. ජාතිකත්වයක් ගැන හැඟීමක් නොමැති රනිල් වික්‍රමසිංහ මහතාට වුව ද ජාතික වේදිකාවේ කියැවෙන වචන යොදාගැනීමට සිදු වී ඇත. ඒ එසේ වුවත් ඒ මහතාගේ ඊනියා ජනතා න්‍යාය පත්‍රය මහරාජා - කොටි - නෝර්වේ න්‍යාය පත්‍රයක් මිස අනෙකක් නො වෙයි. එහි ඇත්තේ ජනතා අපේක්ෂා නොව ඉහත කී අයගේ බලාපොරොත්තු වෙයි. ඇංකර් කිරි පිටි මිල අඩුකිරීමෙන් වික්‍රමසිංහ මහතා බලාපොරොත්තු වන්නේ මහාරාජා සමාගමට කිරි පිටි පැකට්ටුවක මිල සහ විකුණන මිල අතර වෙනස මහාරාජා සමාගමට ගෙවා රජයේ මුදලින් ඒ සමාගමට සහනයක් සැලසීම ය. කොටි සමග සාකච්ඡා කිරීමට වික්‍රමසිංහ මහතා බලාපොරොත්තුවන්නේ ත්‍රස්තවාදීන්ගේ කොන්දේසි පිළිගනිමින් ය. නෝර්වේ රාජ්‍යයට අවශ්‍ය අන්දමින් ඒ ඊනියා සාකච්ඡා කිරීම වික්‍රමසිංහ මහතාගේ අදහස වෙයි. එහි දී බටහිරින් නඩත්තු කෙරෙන රාජ්‍ය නොවන සංවිධාන වික්‍රමසිංහ මහතා සමග වෙයි.

එළඹෙන ජනාධිපතිවරණය යනු හුදෙක් මහින්ද රාජපක්ෂ මහතා හා රනිල් වික්‍රමසිංහ මහතා අතර කෙරෙන සටනක් නොවේය යන්න ද අද දේශපාලන වේදිකාවෙන් ඇසෙයි. මේ ජනාධිපතිවරණය මෙරට යටත්විජිතවිරෝධී නිදහස් සටනෙහි තවත් ප්‍රධාන පියවරක් වෙයි. එහි පෙරමුණෙහි පනස්හයේ දරුවෝ වෙති. ඉතිහාසයෙහි එක් ප්‍රධාන නිදහස් අරගලයක් ලෙස පැවැත්වෙන ජනාධිපතිවරණය පිළිබඳ අවබෝධයක් ලැබීමට ඉතිහාසය ගැන යම් දැනුමක් ලබා සිටිය යුතු ය. ඒ දැනුම ලබාගැනීමේ අරමුණින් ලක්හඬ ගුවන්විදුලි සේවය අඟහරුවාදා හා ඉරිදා රාත්‍රී 9.30ට ජනජය නංවන  විද්වත් කතිකාව නමින් වැඩසටහනක් ආරම්භකර ඇත.

1817-18න් පසු අපට අපේම වූ නායකයෝ නො සිටියහ. කැප්පෙටිපොළ නිළමෙ වැනි නායකයන් ඝාතනයකරනු ලැබීමෙන් හා ඉතිරි නායකයන් කිහිප දෙනා තනතුරු හා වරප්‍රසාද දී බ්‍රිතානීන්ට සේවයකිරීම සඳහා යොදාගැනීමෙන් පසුව අපට සාම්ප්‍රදායික නායකයෝ නො සිටියහ. අපේ නායකයෝ බ්‍රිතානීන් විසින් පත්කරනු ලැබූ යටත්විජිතවාදී නියෝජිතයෝ වූහ. ජාතික මුල් සිඳගත් මේ පිරිස එලොවටත් මෙලොවටත් නැති ගන්ධබ්බයෝ වූහ. ඔවුන් දැනසිටි එකම කරුණ සුද්දන්ට සේවයකිරීම පමණ ය. මොවුහු අනගාරික ධර්මපාලතුමාගේ බසින් නම් කළු සුද්දෝ වූහ.

© Prof. Nalin De Silva

පෘතුගීසි සමයෙහි ද යටත්විජිතවාදීන්ට සේවයකළ සිංහලයෝ සිටියහ. ඔවුහු පෘතුගීසින්ගේ ලස්කිරිඤ්ඤ හමුදාවෙහි සේවයකළහ. නම පමණක් නොව බොහෝවිට ආගම ද වෙනස්කළ මේ පිරිසට පෘතුගීසින්ගෙන් තාන්න මාන්න ලැබුණි. ලන්දේසි සමයෙහි ද යටත්විජිතවාදීන්ට සේවයකළ අය වූහ. එයට බොහෝ කාලයකට පෙර එළාර රජුගේ හමුදාවේ සේවයකළ සිංහලයන් සිටි බව මෙනෙහි කළවිට පෙනීයන කරුණක් නම් සෑම අවධියක ම ආක්‍රමණිකයන්ට සේවයකළ සිංහලයන් මෙරට වාසයකර ඇති බව ය. එබැවින් අද විජාතික බලවේගවල ඇතැම් දේශපාලන පක්ෂ පමණක් නොව බටහිර ක්‍රිස්තියානි රටවලින් නඩත්තු කෙරෙන රාජ්‍ය නොවන සංවිධානවල ඊනියා උගතුන් හා උද්ඝෝෂකයන් සිටීම පුදුමයක් නො වෙයි. එළාරට සේවය කළ මිත්‍ර නම් සෙනෙවියාගේ නමින් මොවුන් ද්‍රෝහිමිත්‍රගේ මුණුබුරන් ලෙස හඳුනාගැනීමේ වරදක් නැත. මිත්‍ර සෙනෙවියා නන්දිමිත්‍ර සෙනෙවියාගේ මාමා කෙනකු යැයි කියැවෙයි. එළාරට සේවයකළ මිත්‍ර ද්‍රෝහිමිත්‍ර හෝ මිත්‍රද්‍රෝහි හෝ වෙයි.

අනගාරික ධර්මපාලතුමාගෙන් පසු අපට බ්‍රිතාන්‍යයින් විසින් පත් නොකරන ලද නායකයකු සොයාගැනීම ප්‍රශ්නයක් විය. බණ්ඩාරනායක මහතා බුද්ධ ශාසන කොමිසම් සභාවේ වාර්තාව පිළිගනිමින් ජාතික බලවේගවල නායකත්වය ගැනීමට පෙරට පැමිණිය ද, එතුමා පවා බ්‍රිතාන්‍යයින්ට සේවයකළ පවුලකින් පැවත එන්නකු විය. එතුමාට එතුමාගේ පවුල් පසුබිම කඩාගෙන එමට තරම් ශක්තියක් විය. මෙරට බොහෝ ප්‍රභූ ඇංග්ලිකන් ක්‍රිස්තියානි පවුල්වල හා ප්‍රභූ ඕල්කට් බෞද්ධ පවුල්වල බොහෝවිට බ්‍රිතාන්‍යයින්ට සුවච ව සේවයකළ අය වූහ. අපේ ඊනියා නායකයන් අපට ලැබුණේ මේ පවුල්වලින් ය. සේනානායකලා, කොතලාවලලා, බණ්ඩාරනායකලා, ජයවර්ධනලා, වික්‍රමසිංහලා එවැනි පවුල්වල උපත ලැබුවෝ වූහ. ඩොනමෝර් යුගයේ හා ඉන්පසුව අපේ නායකයන් ලෙස බ්‍රිතාන්‍යයින් විසින් පත්කෙරුණේ එවැන්නන් ය.

මේ සම්මතයට පිටින් ආ නායකයා වූයේ ප්‍රේමදාස මහතා ය. එහෙත් ඒ මහතාගේ පක්ෂය විජාතික බලවේගවල සෘජු නියෝජිතයා වූ බැවින් ඔහුට කළහැකිව තිබූ කාර්යය සීමිත විය. අද ශ්‍රී ල නි පක්ෂයේ ද ජාතික බලවේගයේ ද නායකයා වී සිටිනුයේ මහින්ද රාජපක්ෂ මහතා ය.  ඒ මහතාගේ පවුල් පසුබිම වික්‍රමසිංහ මහතාගේ පවුල් පසුබිමෙන් වෙනස් වෙයි. එහෙත් මෙයින් කියැවෙන්නේ රාජපක්ෂ මහතා පරමාදර්ශී නායකයකු යන්න නො වෙයි. විශේෂයෙන් ම ඒ මහතා තමා වටා සිටින්නවුන්ගේ සිරකරුවකු වීමෙන් වළකාගත යුතු වෙයි. රාජපක්ෂ මහතා දැනටමත් අභියෝග රාශියකින් ජයගෙන ඇත. ඒ මහතාට ජනාධිපති අපේක්ෂක ධුරය ලැබීම ම ජයග්‍රහණයකි. එයටත් වඩා ශ්‍රී ල නි පක්ෂ නායකත්වය ද ඇතුළු විජාතික බලවේගවල බලපෑම් පරාජය කරමින් ඒකීය ලංකාවක් යන ශ්‍රී ල නි පක්ෂයේ මුල් ප්‍රතිපත්තියට ආපසු යෑම සියළු ජාතික බලවේගවල ජයග්‍රහණයකි. ජාතික ආර්ථිකයෙහි මූලධර්ම තවම සූත්‍රගත නොකළ ද අඩුම තරමින් ප්‍රතිපත්තියක් ලෙස ජාතික ආර්ථික ව්‍යුහයක් සකස්කිරීම මහින්ද රාජපක්ෂ මහතා විසින් පිළිගැනී ඇත.

එහෙත් ඒ මහතාට මහත්ම අභියෝගය එල්ලවන්නේ නොවැම්බර් මස දහඅටවැනිදාට පසුව ය. සියළු විජාතික බලවේග නැවත වරක් ජනතාවට පිටුපෑමට උත්සාහ කරනු ඇත. ඊනියා ප්‍රජාතන්ත්‍රවාදය යටතේ බොහෝ විට කෙරෙන්නේ පුද්ගලයකු තෝරාපත්කරගැනීම මිස ප්‍රතිපත්ති පිළිබඳ තීරණයක් ගැනීම නො වෙයි. ජනතාව ප්‍රතිපත්තිවලට ඡන්දය දෙනවා විය හැකි ය. එහෙත් ජයග්‍රහණයකිරීමෙන් පසුව ජයග්‍රහකයා හැසිරවෙන්නේ ජනතාවට අවශ්‍ය අන්දමට නො වෙයි. යම් පුද්ගලයකු  යම් ප්‍රතිපත්තියක් වෙනුවෙන් පෙනී සිට ජයගත්ත ද, විදේශීය මෙන් ම දේශීය විජාතික බලවේග නොයෙකුත් බලපෑම් යොදා ඒ ප්‍රතිපත්ති වෙනස්කිරීමට උත්සාහ කරයි.  අද රාජපක්ෂ මහතා වටා සිටින පුද්ගලයන්ගෙන් ඇතැමෙක් සති කිහිපයකට පෙර ද සන්ධීය හෝ සහසන්ධීය රාජ්‍යයක් වෙනුවෙන් පෙනී සිටියහ. ඔවුන් එක්කෝ දරුණුම ගණයේ අවස්ථාවාදීන් විය යුතු යෂ නැත්නම් උපක්‍රමශීලීව රාජපක්ෂ මහතාට දැනට සහාය දී පසුව ඔවුන්ගේ ප්‍රතිපත්ති ඉදිරියට ගෙනයෑමට බලාපොරොත්තුවෙන් සිටිනවා විය යුතු ය. මොවුන් පරාජයකිරීම ද පනස්හයේ දරුවන්ගේ වගකීමක් වෙයි.

එහෙත් වඩාත්ම අමාරු කාර්යය වනුයේ මොවුන් පරාජයකිරීම ය. ඡන්දය දීමෙන් පසුව ජනතාව තීරණගැනීමේ ක්‍රියාවලියට හවුල්වීමක් නැත. පනස්හයේ ආණ්ඩුවේ ද එවැනි අත්දැකීම් ඇත. පිලිප් ගුණවර්ධන මහතා වැඩිකල් නොගොස් ආණ්ඩුවෙන් ඉවත්කෙරුණු අතර ඉන් කලකට පසු බණ්ඩාරනායක මහතා ඝාතනය කෙරිණි. එමෙන් ම එතුමා ලවා බණ්ඩාරනායක - චෙල්වනායගම් ගිවිසුම ක්‍රියාත්මක කරවීමට ද ඇතැමුන්ට අවශ්‍ය විය. ඒ අත්දැකීම්වලින් පනස්හයේ දරුවන් පාඩම් ඉගෙන ගතයුතු ය.

© Prof. Nalin De Silva